# කො කො



G.V.R. කිත්නුලි වෙතුම්යා විජේරත්න

# “කොකෝ”

G.V.R. කිත්නුලි වෙතුමියා විජේරත්න

| | | |
|---|---|---|
| කෘතියේ නම | : | කොකො |
| ප්‍රථම මුද්‍රණය | : | 2023-12-17 |
| කථාව සහ චිත්‍ර | : | කිත්නුලි වෙතුමියා විජේරත්න |
| කතෘගේ ලිපිනය | : | නො: 18,<br>ගාලේවත්ත හරස් පාර,<br>කටුගස්තොට. |
| පාසල | : | මහා මහාමායා බාලිකා විදුහල, මහනුවර |
| ශ්‍රේණිය | : | 2B |
| ISBN අංකය | : | |

# පිදුම

නිති දැනුමෙන් පෝෂණය කරන්නට වෙර දරන,

මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,

පන්තිභාර ගුරුතුමිය,

ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,

මා පෝෂණය කරන, ඇතිදැඩි කරන

මාගේ මව්නි, පියාණෙනි ඔබ දෙපලටත්,

මා වැනිම දැනුම හඹා යන

මාගේ සොයුරු කැළටත්

මේ පොත ආදරයෙන් පුද කරමි.

* * *

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වු අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-01-01

එක දවසක් හැන්දෑවේ මම යි අත්තම්ම යි වෙනදා වගේ ම අම්ම යි අප්පච්චි යි එනකල් මඟ බලාගෙන හිටියා.

මට අපේ කාර් එක එන සද්දය ඇහුණා. මම දොර ඇරගෙන එළියට පැන්නා.

''චූටි මැණික.. බලන්න අපි ඔයාට තෑග්ගක් ගෙනාවා.'' අම්මා කිව්වා.

මමත් කාර් එක ළඟට දුවගෙන ගියේ මට කන්න මොනවහරි ගේන්න ඇති කියලා.

එක පාරට ම මම දැක්කේ කළුම කළු පාට බෝලයක් අම්මා වඩාගෙන ඉන්නවා.

අනේ ලස්සන බලු පැටියෙක් !

මට හරිම සතුටක් දැණුනා.



එයාව ගේ ඇතුලට අරන් ගිහින් අපි එයාට ඉන්න තැනක් හදලා දුන්නා.

මම එයාව ආදරයෙන් අතගෑවා.

එයත් ඇස් දෙක ඇරලා මගේ දිහා බලාගෙන හිටියා.



‘‘අම්මේ.. අපි මෙයාට දාන නම මොකක්ද ?’’

‘‘ඔයා කැමති නමක් දාමු.’’ අම්මා කිව්වා.

නම් ගොඩක් අතරින් අපි එක නමක් තෝරා ගත්තා.

‘‘කොකො’’ ඔව් ඒ තමයි එයාගේ නම. කොකො කියන්නේ කළු යි, දුඹුරු යි පාට දිග බලු පැටියෙක්. සොසේජ් ඩෝග් කෙනෙක්, වැඩිය උසත් නෑ. දිගම දිගයි.



මම එයාව හරි ම ආදරෙන්, ආසාවෙන් බලා ගත්තා. එයත් එක්ක සෙල්ලම් කළා. ඇවිදින්න ගියා.

දවසක් අපිට දුර ගමනක් යන්න වුණා. ඉතින් කොකෝව එහෙ ගෙනියන්න බැරි නිසා අපේ ගෙදර ළඟ ම ඉන්න ලොකු අම්මලාගේ ගෙදර තියලා ගියා.

එහෙ ඉන්නවා තවත් බලු පැටියෙක්, එයාගේ නම ''කේටී''. අපේ කොකො හරිම ආසාවෙන් කේටීත් එක්ක හිටියා.

අපි අපේ ගමන ගිහින් ආව ගමන් කොකෝව අරන් එන්න ලොකු අම්මලාගේ ගෙදර ගියා.

අනේ ඒත් කොකො අපිත් එක්ක ගෙදර යන්න ආවේ නෑ. එයාට අලුත් යාළුවෙක් හම්බවෙලා. මාව අමතක කරලා.



මට හරියට දුක හිතුණා. මම ගෙදර ඇවිත් හොඳට ම ඇඬුවා. මට හිටිය එක ම යාළුවත් මට නැති වුණා.

ඒත් අප්පච්චි කිව්වා ''අපි හැම වෙලාවේ ම ගෙදර නැති නිසා එයාටත් පාළු ඇති. ඒක නිසා එයා යාළුවත් එක්ක සතුටෙන් හිටපුදෙන්'' කියලා.

ඔව්.. මම ඉස්කෝලේ ගියාම එයාටත් මට වගේ ම පාළු ඇති. මම හරි ම දුකෙන් එයාගේ අලුත් යාළුවත් එක්ක එයාට ඉන්න දීලා ගෙදර ආවා. එයාව බලෙන් තියාගෙන ඉන්න එක එයාට දුකක් නිසා මම අමාරුවෙන් වුනත් එයාව ලොකු අම්මලාට තියාගන්න දුන්නා.

හැබැයි මම තාමත් එයාව බලලා එන්න අමතක කරන්නේ නෑ. මම මගේ කොකෝට හැමදාමත් ආදරෙයි.

මම ආයෙත් මගේ තනියට බලු පැටියෙක් ගේනවා. එක්කෙනෙක් නෙවෙයි හැබැයි, දෙන්නෙක්.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුර අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023-11-01